ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**මහාමාර්ග අමාත්‍යාංශය**

**මාර්ග සංවර්ධන අධිකාරිය**

# පුරප්පාඩු

## මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පුද්ගලික ලේකම් තනතුර

මාර්ග සංවර්ධන අධිකාරියේ පුද්ගලික ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුද්ගලික ලේකම් තනතුර සඳහා අවශ්‍ය වන සුදුසුකම් සහ පළපුරුද්ද පහත දක්වා ඇත;

**01. අවම සුදුසුකම් සහ පළපුරුද්ද**

අ. අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම

i. සිංහල/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

සහ

ආ. අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විෂයයන් තුනකින් සමත් වීම (පොදු ප්‍රශ්න පත්‍රය හැර)

සහ

ඇ. 1. ලඝු ලේඛනය පිළිබඳ ප්‍රමාණවත් ප්‍රවීණතාව.
2. පරිගණක යෙදුම් සම්බන්ධව ලබාගත් සුදුසුකම්.
3. ඉංග්‍රීසි සහ සිංහල භාෂාවලින් ඉතා හොඳින් සංවාදයේ යෙදීමට සහ ලේඛනයේ යෙදීමට ඇති හැකියාව.
4. ඉතා හොඳ වචන සැකසුම් කුසලතා සහ කාර්යාල උපකරණ හැසිරවීමේ හැකියාව.

**02. වයස් සීමාව**

අවුරුදු 45 ට අඩු (දැනට රාජ්‍ය දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අය සඳහා වයස් සීමාව අදාළ නොවේ)

**03. වැටුප් පරිමාණය සහ ශ්‍රේණිය**

MA 1-2 - 2016 (Grade III) Rs.27,910 - 300 x 18 - 33,310/-) සහ රජයේ අනුමත දීමනා.

**04.රැකියා නියමයන්**

පත්වීම කොන්ත්‍රාත් පදනමින් සිදු කෙරෙනු ඇත.

**05. වෙනත් ප්‍රතිලාභ**

සේවකයාගෙන් අය කෙරෙන 8% ට අමතරව අධිකාරිය විසින් 12% ක දායකත්වයක් සේවක අර්ථ සාධක අරමුදලට බැර කරන අතර සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. අනෙකුත් රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

සුදුසුකම්, පළපුරුද්ද, වෙනත් අදාළ තොරතුරු සහ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර සහිත අයදුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ (පාලන), මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට 2022/01/21 දිනට පෙර එවිය යුතු අතර දැන්වීමේ සඳහන් තනතුර ලියුම් කවරයේ ඉහළ කෙළවර වම්පස සඳහන් කළ යුතු ය.

දැනට රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරිවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**

**මාර්ග සංවර්ධන අධිකාරිය**